# විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## 5. ඇඳීමේ හා පින්තාරු කිරීමේ ඩිප්ලෝමා පාඨමාලාව - 2022/2023
## (Diploma in Drawing and Painting - 2022/2023)

**පාඨමාලා කාලය** :- අවුරුදු 01 කි.

**සුදුසුකම්** :- අ. පො. ස (උ. පෙළ) විභාගයෙන් විෂයයන් 03 කින් සමත්ව තිබීම සහ ඉන් එක් විෂයයක් චිත්‍ර විෂය වීම

හෝ

ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂයන් 03 කින් සමත් වීම සහ චිත්‍ර විෂය ඇතුලුව අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම

හෝ

අ.පො.ස. (සා. පෙළ) හා අ.පො.ස. (උ. පෙළ) විභාගය සමත් වී ඇති නමුත් එම විභාග සඳහා චිත්‍ර කලාව විෂයක් ලෙස හදාරා නොමැති එහෙත් අදාළ ක්ෂේත්‍රයේ සේවා පලපුරුද්ද ලබා තිබීම

හෝ

අ.පො.ස. (සා. පෙළ) චිත්‍ර විෂය සමත් වීම හා අදාළ විෂය ක්ෂේත්‍රයේ ඇති නිපුණතාවය සහ පලපුරුද්ද ඇති අනාගත රැකියා අභිවෘද්ධිය අපේක්ෂා කරන අයෙකු වීම

**සහ**

**විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වීම**

**සැ.යු. :-** අයදුම්කරු විසින් සවිස්තරාත්මක නිර්මාණ ගොනුවක් (Portfolio) සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය

**මාධ්‍යය** :- සිංහල හා ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** :- රු.100,000/- (වාරික 03 කින් ගෙවීම් කළ හැක.)
(මූලික වාරිකය රු.70,000/- කි. දෙවන හා තෙවන වාරිකය රු15,000/- බැගින්)

**දේශන** :- ලිඛිත හා ප්‍රායෝගික දේශන **ඉරිදා දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා** විශ්වවිද්‍යාලයේ අනුමත ක්‍රමවේද යටතේ පැවැත්වේ.

❖ මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත ලේඛනවල මුල් පිටපත් scan කොට (PDF documents) සකස්කර ගත යුතුය.
1. ජාතික හැඳුනුම්පතෙහි දෙපස පැහැදිලි ඡායාරූප
2. උප්පැන්න සහතිකයෙහි දෙපස පැහැදිලි ඡායාරූප
3. අයදුම්පත් ගාස්තු ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ පැහැදිලි ඡායාරූපයක්
4. මෙම පාඨමාලාවේ සුදුසුකම් වලට අදාළ ලේඛන වල පැහැදිලි ඡායාරූප

**ඉහත ලේඛන හා සහතික වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු වේ.**

❖ මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් ගාස්තු ලෙස අය කරනු ලබන රු. 1,000/- ක මුදල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ජංගම ගිණුම් අංක **71876640** දරණ ගිණුමට බැරවන සේ ඕනෑම ලංකා බැංකු ශාඛාවක **කවුන්ටරය මගින් පමණක්** බැර කර ලබා ගන්නා කුවිතාන්සිය මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උඩුගත (Upload) කළ යුතුය.

නැතහොත්

විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය **www.vpa.ac.lk** හි Pay Online හරහා ගෙවීම් කරන්නේ නම් රු. 1030.00 ක මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස ගෙවීම් කර ලබා ගන්නා ලදුපත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උඩුගත (Upload) කළ යුතුය.

❖ **අයදුම්පත් යොමු කළ යුතු ආකාරය :-** අයදුම්කරුවන් මෙහි දැක්වෙන සබැඳිය ඔස්සේ පමණක් මාර්ගගත ක්‍රමයට (Online) අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම පාඨමාලාවට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම අයදුම් කළ හැකි අවසන් දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **එවැනි අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

❖ අයදුම්කළ හැකි අවසන් දිනය 2022.09.19 වේ.

විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
දුරකථන අංක: 0112854549/0112821338
E-mail codl@vpa.ac.lk